**ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකල විගණන මතය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**----------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන**,** වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්**,** ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර**,** මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්**,**

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2018 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.17,262,313.94 ක් ලෙස දක්වා තිබුණද 2017 වර්ෂයේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව අනුව 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.43,789,809 ක් ලෙස සඳහන්ව තිබුණි. එසේම නව CIGAS වැඩසටහන මගින් ජනනය කළ වත්කම් වාර්තාවේ 2018 ජනවාරි 01 දිනට ශේෂය රු.35,076,457 ක් ලෙස දැක්වුණි. | වටිනාකම් එකිනෙකට සැසඳිය යුතු අතර වෙනස්කම් පවතීනම් හේතු සංඛ්‍යාත්මක පැහැදිලි කළ යුතුය. | 2004.01.01 දිනෙන් පසුව අත්පත් කරගත් වත්කම් වල වටිනාකම් පමණක් විසර්ජන ගිණුමට ඇතුලත් කල යුතුවූ අතර නව CIGAS වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුවට අයත් සියලුම වත්කම් ඇතුලත් කිරීම කලයුතු වූ බැවින් විසර්ජන ගිණුමේ ශේෂයත්, CIGAS වැඩසටහනේ ඇතුලත් ශේෂයත් අතර වෙනසක් පැවතිය හැකිය.<br><br>2015 වර්ෂයේදී ස්ථාවර වත්කම් තක්සේරු කිරීමේ කමිටුවක් මගින් ලබාදුන් තක්සේරු වටිනාකම් වලට අනුව ආරම්භක ශේෂ ඇතුලත් කර ඇත.<br><br>නිවැරදි කරන ලද 2018.12.31 දිනට වත්කම් ශේෂය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල වාර්තාවේ අවසන් ශේෂය අනුව ද නිවැරදි වේ. |

**1.6.2 අත්තිකාරම් ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ඉක්මවූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.408,304 ක ණය ශේෂ පැවතුණි. | රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සේවය හැර ගොස් විදේශ ගතවී ඇති බැවින් ලිපිනය සොයා ගත නොහැකි නිසා එකී රු. 75,845 ක මුදලට අදාල ලිපි ගොනුව වසා දමන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව 2017.09.18 දින දන්වා ඇත. වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකුගේ රු. 332,459 ක ණය ශේෂය අයකර ගැනීමට මේ වනවිට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩබැලීමේ පත්කිරීමක් ලබාදිය යුත්තේ කළයුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරකට පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරිම නොපමාව කළයුතුය. පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නොවේ නම් 13.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු බව සඳහන් වුවද අධ්‍යක්ෂ තනතුරෙහි නිරත නිලධාරියකු සඳහා 2017 ජනවාරි 19 වන දින සිට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීමේ පත්වීමක් ලබාදී තිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | තනතුරේ සේවය කල නිලධාරියා විශ්‍රාම ගිය පසු ගණකාධිකාරී සේවයේ ජොෂ්ඨතම නිලධාරියා තනතුරේ වැඩ බැලීම සඳහා පත් කිරිමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.<br><br>එම තනතුරට නිත්‍ය නිලධාරියෙකු පත් කරන ලෙස ඉල්ලීම් කර ඇති නමුත් මේ දක්වා නිලධාරියෙකු පත් කර නොමැත. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අවස්ථා පහත පරිදි වේ.<br>• සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් නොකිරීම.<br>• සමස්ථ කාර්ය මණ්ඩලයේ නිශ්චිතව පැවරුණු වගකීම්වලට අදාලව පවතින නිපුණතා සහ රාජකාරි සාර්ථකත්වය සඳහා පැවතිය යුතු නිපුණතා අතර පරතරය හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.<br>• නිපුණතා පරතරය අවම කිරිම සඳහා ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබීම.<br>• මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම අවම | චක්‍රලේඛයට අනුගතව කටයුතු කළ යුතුය. | ඔබ විසින් ලබාදී ඇති උපදෙස් අනුව නිපුණතා පරතරය අවම කිරීම සඳහා අප දෙපාර්තමේන්තුවට සුදුසු මානව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික විය යුතුය. 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් 70 ක ගෙන් සමන්විත වූ අතර, 2018 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයන් 43 දෙනෙකු සඳහා පමණක් එනම් සියයට 61 ක් සඳහා දේශීය හා විදේශ පුහුණු අවස්ථා ලබා දී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලාභ ආදායම්** | | |
| (i) ආයතන 06 ක ඇස්තමේන්තු ලාභ ආදායමට සාපේක්ෂව තථ්‍ය ආදායමේ අඩුවීම සියයට 55 ත් 93 ත් අතර පරාසයක පැවතුනි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුය. | ශ්‍රී ලංකා මහබැංකුව විසින් නියම කර ඇති BASEL III අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පවත්වා ගෙනයාම කෙරෙහි මූලිකත්වය දී කටයුතු කිරීම අත්‍යවශ්‍ය බැවින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව යන ආයතනයන්ගෙන් අපේක්ෂා කළ දායකත්වය ලබා ගැනීමට නොහැකි වී ඇත.<br><br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ඇස්තමේන්තුගත මෙහෙයුම් ආදායමෙහි අඩුවීම මත රුපියල් මිලියන 25 ක පමණ දායකත්වයක් ලබා දී ඇත.<br><br>ලංකා අපනයන ණය රක්ෂණ මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීමේ කටයුතු ප්‍රමාදවීම් නිසා අදාළ අනුමැතිය ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් ඇස්තමේන්තුගත ලාභ ආදායමින් රුපියල් මිලියන 15 ක් පමණ ලබා ගැනීමට හැකි වී ඇත.<br><br>උසාවි නියෝගයන් ලැබෙන තෙක් ටෙන්ඩර් කිහිපයක්ම පමා කිරීමට සිදුවීම හේතුවෙන් 2018 වර්ෂයේදී ලබාගැනීමට සැලසුම් කළ පරිදි ආදායම් උපයාගැනීමට නොහැකි වූ |

| | | | |
|---|---|---|---|
| | | | බව ජාතික ප්‍රවාහන කොමිසම විසින් 2018.12.20 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. |
| | (ii) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා පිළිවෙලින් රු.මිලියන 1140 ක්, 211 ක් සහ 300 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල කිසිඳු ආදායමක් ලැබී නොතිබුණි.<br>එසේම පසුගිය වර්ෂ කිහිපය තුලම ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව, ජාතික ලොතරැයි මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ලංකා ඛණිජ තෙල් සංස්ථාව ලාභ ආදායමට කිසිඳු දායකත්වයක් ලබා දී නොතිබුණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුවේ. | ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ගැටළු හේතුවෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු වලින් කිසිඳු ලාභ ප්‍රමාණයක් රැස්කර ගැනීමට නොහැකි වී ඇත. |
| (ආ) | **ලාභාංශ ආදායම** | | |
| | (i) රාජ්‍ය ව්‍යාපාර 03 ක් සඳහා ලාභාංශ ආදායම් ඇස්තමේන්තු කර නොතිබූ නමුත් 2018 වර්ෂය තුළ එම ආයතනවලින් රු.මිලියන 53 ක ආදායම් ලැබී තිබූ අතර රු.මිලියන 200 ක් ඇස්තමේන්තු කර තිබූ ලංකා ඛනිජ වැලි සමාගමෙන් රු.මිලියන 35 ක් පමණක් ලැබීම නිසා ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව තථ්‍ය ආදායමේ අඩුවීම ප්‍රතිශතයක් වශයෙන් සියයට 83 ක් විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුය. | ලාභාංශ ආදායම් ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී පැවැති මූල්‍ය හා මෙහෙයුම් තත්ත්වයන් මත ඇස්තමේන්තුවලට ඇතුළත් නොවුවද අදාළ සමාගම්වලින් ලාභාංශ ආදායම් ලබා ගැනීමට කටයුතු කර ඇත.<br><br>ලංකා ඛණිජ වැලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොකිරීම හේතුවෙන් වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොමැති අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පවත්වනතෙක් අතුරු ලාභාංශ ගෙවන ලෙස ඉල්ලීමක් කර ඇති අතර වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමින් රුපියල් මිලියන 35 ක ලාභාංශ ආදායමක් ලැබී ඇත. |

| | | |
|---|---|---|
| (ii) 2018 වර්ෂය ද ඇතුළුව පසුගිය වර්ෂ කිහිපය තුළම ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබා නොදුන් රාජ්‍ය ව්‍යාපාර 07 ක් නිරීක්ෂණය විය. | රජයට ලැබිය යුතු ආදායම් ලබාගැනීම කෙරේ දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතුවේ. | කහටගහ ග්‍රැෆයිට් සමාගම, පුස්සැල්ලාව වැවිලි සමාගම භාණ්ඩාගාරයේ සුළු කොටස් හිමිකාරීත්වයක් සහිත සමාගමක් වේ. ලාභාංශ ප්‍රකාශයට පත් කළ විට භාණ්ඩාගාරයට හිමි ලාභාංශ ලැබෙනු ඇත.<br><br>මන්තායි සෝල්ට් සමාගම පසුගිය වර්ෂ වලදී සුළු ලාභාංශ ප්‍රමාණයක් ප්‍රකාශිත කර ඇති අතර, එය ගෙවා නොමැති නමුත් 2017 වර්ෂය සඳහා රුපියල් මිලියන 33 ක ලාභයක් ලබා ඇති බැවින්, ඉදිරි වාර්ෂික මහා සභා රැස්වීමේදී මේ පිළිබඳ සලකා බලා ලාභාංශ ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.<br><br>ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව 2018 වර්ෂයේ අග භාගයේදී පැවති මුදල් ප්‍රවාහ තත්ත්වයන් මත ප්‍රකාශයට පත් කරන ලද රුපියල් මිලියන 16 ක ලාභාංශ ආදායම වාරික තුනකින් ලබාදීමට එකඟ වුවද ආයතනයේ එවකට පැවති ද්‍රවශීලතා ගැටළු මත 2018 වර්ෂයේදී එම ලාභාංශ ආදායම ලබා ගැනීමට නොහැකි වූ අතර මෙම ලාභාංශ ආදායමින් කොටසක් 2019 වර්ෂයේ දී ලැබී ඇත.<br><br>ලංකා සීනි සමාගම 2015, 2016 සහ 2017 වර්ෂවල ලාභාංශ ප්‍රකාශයට පත් කර නොමැත.<br>Skill Development Fund Limited දිගින් දිගටම පවතින මෙහෙයුම් අලාභ හේතුවෙන් ලාභාංශ ප්‍රකාශයට පත්කර නොමැත. |
| | අලාභ ලැබීමට හේතු වූ කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ පැවැති මෙහෙයුම් අලාභය හමුවේ පෙට්රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් සමාගමෙන් ලාභාංශ ආදායම් භාණ්ඩාගාරයට ලැබී නොමැත. |
| (ඇ) 2017 දෙසැම්බර් 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව පැවරීමෙන් ලත් මුදල් ආදායම් සම්බන්ධයෙන් ගණන්දිමේ නිලධාරී ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර තිබූ අතර රාජ්‍ය පෞද්ගලික | සංශෝධිත ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කල යුතුය. | 2018 ආදායම් ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන ලද්දේ 2017 වර්ෂයේ තුන්වන කාර්තුවේදී වන අතර 2017.12.20 දිනැති ලිපිය මඟින් මෙම ආදායම් ශීර්ෂයේ ආදායම් ගණන්දීමේ නිලධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව පත් කර තිබුණි. |

| | | |
|---|---|---|
| හවුල්කාරීත්වයක් ලෙස 2017 ජූලි මස 29 දින අත්සන් කරන ලද අනුග්‍රාහක ගිවිසුම ප්‍රකාරව හම්බන්තොට වරාය බදුදීමෙන් ලද රු.මිලියන 44,677 ක ආදායමක් 2017 වර්ෂය සඳහා ගිණුම් ගතකර තිබුණි. එම ගිවිසුම් ප්‍රකාරව 2018 වර්ෂය තුළ ලැබී තිබූ ඇ.එ.ජ.ඩො.681,560,600 ක මුදල් 2018 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණි. | | |

**2.2 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයයකට ඇස්තමේන්තුවක් නොතිබුණු අතර පරිපූරක ඇස්තමේන්තුවක් මගින් සලසා තිබූ රු.මිලියන 2 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ සියයට 38 ක් පමණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කල යුතුය. | 2509 - 2018 වර්ෂය තුල පැවති දේශපාලන තත්ත්වයන් හේතුවෙන් අපේක්ෂා කල පරිදි (Innovators to Industry Initiatives) වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 06 ක ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව රු.430,140,000 ක් වූ අතර ඉතිරිවීම් රු.425,539,201 විය. එම ඉතිරිවීම් ප්‍රතිශතයක් ලෙස සියයට 23 සිට 100 දක්වා පරාසයක පැවතිණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කල යුතුය. | අපේක්ෂා කල පරිදි රාජකාරී ගමන් නොයෙදීම හා දෙසැම්බර් මස ගෙවීම් වවුචර් එම මාසයේදීම ඉදිරිපත් නොවීම, අපේක්ෂා කල පරිදි විදේශ ගමන් නොයෙදීම, නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්, අපේක්ෂා කළ පරිදි නඩත්තු කටයුතු ඇති නොවීම, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි අක්‍රිය ගිණුම් ප්‍රතිපූර්ණය සඳහා අක්මුදල් නොලැබීම සහ අපේක්ෂා කල පරිදි නිලධාරීන් ණය ලබා නොගැනීමත් තවත් නිලධාරීන් කිහිපදෙනෙකු ස්ථාන මාරුවී යාම වැනි හේතුන් නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානම ආයතනය බවට පත්වීමේ දැක්ම සහිතව ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සිය අධීක්ෂණය යටතේ පවතින රාජ්‍ය ව්‍යාපාරවල පාලිත සමාගම් අධීක්ෂණය සම්බන්ධයෙන් තමා සතු කාර්යභාරය සහ වගකීම මෙතෙක් නිශ්චිතව හඳුනා ගෙන ඇති බව තහවුරු නොවීය. | දැක්ම හා මෙහෙවර ප්‍රකාරව අධීක්ෂණය සම්බන්ධයෙන් වන වගකීම නිවැරදිව හඳුනාගත යුතුය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ පවතින පාලිත සමාගම්වල අධීක්ෂණය සම්බන්ධයෙන් අප දෙපාර්තමේන්තුව සතු වගකීම, කාර්යභාරය හා නිර්ණායකයන් පිළිබඳ විගණකාධිපතිගේ උපදෙස් අනුව සාකච්ඡා කර හඳුනාගැනීමට ඉතා ඉක්මනින් කටයුතු කරමි. මේ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරින් සමඟ කමිටුවක් පත්කර ක්‍රමවේදයක් සකස් කිරිමට නියමිතය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රාජ්‍ය ව්‍යාපාරවල මෙහෙයුම් ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම තුළින් යහපාලනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, රාජ්‍ය ව්‍යාපාර ආයතන විසින් ඉදිරිපත් කරන අත්පොත් (Manuals) සමාලෝචනය කර අනුමත කිරීම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකමක් ලෙස දක්වා තිබුණද එම කාර්ය සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි. | මෙහෙයුම් ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා අත්පොත් අනුමත කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුය. | ඉදිරිපත් වී ඇති කාර්ය සංග්‍රහ (Manuals) පරීක්ෂාකර අනුමැතිය ලබාදීම සංකීර්ණ කාර්යයක් බව නිරීක්ෂණය කරමි. එබැවින් ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කර ආයතන විසින් ඉදිරිපත් කර ඇති කාර්ය සංග්‍රහ (Manuals) අනුමත කිරීමේ කටයුතු කිරීමට අපේක්ෂා කරමි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය අධීක්ෂණය කිරීමේ අරමුණින් ඔවුන්ගේ සංයුක්ත සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් සහ 2018 වාර්ෂික අයවැය සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවල සැලසුම්හි නිවැරදි කිරීම් | සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් ආයතනවල | 2018 වර්ෂයේ මේ වනවිට ලැබී ඇති සංයුක්ත සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් සහ 2018 වාර්ෂික අයවැය සමාලෝචනය කිරීම පැවරී ඇති අනෙකුත් රාජකාරී කටයුතු සමඟ සිදු |

| | | | |
|---|---|---|---|
| | සහ යෝජනා ලබාදීම ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබූ අතර 2018 වර්ෂය තුළ සමාලෝචනය සඳහා ඉදිරිපත් වූ සැළසුම් සහ අයවැය සංඛ්‍යාව 100 ක් වුවද සියයකගෙන් (100) සමාලෝචන කටයුතු නිමකර තිබුණේ හරි අඩක පමණි. | කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. | කිරිමේදී ප්‍රමාදයක් සිදු වී ඇති නමුත්, මේ වන විට ඉතිරි වාර්තා සමාලෝචනය කරමින් පවතී. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ස්වර්ණමය කොටස් හිමියාගේ රැස්වීම් පැවැත්වීම එක් කාර්යයක් ලෙස දක්වා තිබුණද 2018 වර්ෂය තුළ එම රැස්වීම් පවත්වා නොතිබුණි. | යෝජිත පරිදි රැස්වීම් පැවැත්වීම තුලින් ආයතනවල කාර්යසාධනය ඉහල නැංවීමට කටයුතු කිරීම කළ යුතුය. | රන් කොටස් හිමිකරු ලෙස වැවිලි සමාගමක ඉහල කළමනාකාරීත්වය සමග රැස්වීම් පවත්වා ඇති අතර, ස්වර්ණමය කොටස් හිමියන්ගේ රැස්වීමක් පැවැත්වීමට අවශ්‍ය ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කාර්ය සාධන වාර්තාවක් ලබාදෙන ලෙස වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය වෙත දැනුම් දී ඇත. |

**3.3** **කළමනාකරණ දුර්වලතා**

---------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාරවල මෙහෙයුම් සහ මූල්‍ය ක්‍රියාකාරකම්හි අධිකාරී බලය හිමිවන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට වන අතර 2018 වර්ෂය තුළ රාජ්‍ය ව්‍යාපාර 08 ක සැලකිය යුතු කාලයක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් මුදල් අමාත්‍යාංශය විසින් පත්කර නොතිබීම මත මෙම ආයතනවල කාර්යසාධනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවන බව නිරීක්ෂණය විය. අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීමේ කටයුතු මුදල් අමාත්‍යාංශය මගින් සිදු කළද රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කරන ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වගකීම ප්‍රමාණවත් ලෙස ඉටුකර තිබෙන බවට තහවුරු නොවීය. | රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය උදෙසා හැකිතාක් උපරිමයෙන් කටයුතු කල යුතුය. | මේ වන විට රාජ්‍ය ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරිමේ කාර්ය රාජ්‍ය ව්‍යාපර දෙපාර්තමේන්තුව මගින් සිදු නොකරන බව කාරුණිකව දන්වන අතර එය මුදල් අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව දැනුවත් වී ඇති නමුත් අරමුණු ලඟා කර ගැනීමට අවශ්‍ය ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ලඟා විය යුතු සන්ධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා අවශ්‍යවන දර්ශකද හඳුනාගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම ක්‍රියාකළ යුතුය. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ නිලධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන් සකස්කර එමගින් ලඟාවිය යුතු ඉලක්ක සහ ප්රගතිය මැන බැලීමේ දර්ශක හඳුනා ගැනීමට ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 79 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 70 ක් වූයෙන් පුරප්පාඩු 09 ක් විය. එය ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 කින්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 02 කින් සහ ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 01 බැගින් සමන්විත විය. | පුරප්පාඩු පිරවීමට හෝ එසේ අවශ්‍ය නොවන්නේ නම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනයට හෝ කටයුතු කළයුතුය. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |